# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - ප්‍රථම වසර - 2018

## නීති විධි ක්‍රම

**පැ තුනයි (03)**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

**01.** නීතිය, 'සමාජය හොඳින්ම ශිෂ්ට සම්පන්න කරන්නා' ලෙස බොහෝ දෙනෙකු විසින් සළකනු ලැබුවද 'නීතිය යනු කුමක්ද?' යන පැනයට තනි අර්ථනිරූපනයක් දීම දුෂ්කර වෙයි. එමනිසා නීතිය තේරුම්ගැනීම පිළිබඳව, කලින් කලට විවිධ නීති ගුරුකුළ ආධිපත්‍ය දරා තිබේ.

ඕනෑම නීති විද්‍යාත්මක ගුරුකුල දෙකක් ඇසුරුකරගනිමින් සහ ඔබගේ පිළිතුර නිදසුන් මගින් සනාථ කරමින් උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**02.** නමින් අභිචෝදක පක්ෂය සහ විත්තිය යන දෙපර්ශවය අතර සිදුවන විවෘත තරගයක් මගින් සත්‍ය මතු කර ගැනීමට එදිරිවාදී පද්ධතිය නිර්මනාණය වී ඇත. එදිරිවාදී පද්ධතියට සපුරාම පටහැනි ආකාරයට, පෘථුල විමර්ශනයක් සහ සියලුම සාක්ෂි පරීක්ෂා කිරීම මගින් කරුණු ඔප්පුකිරීම තුළ අධිකරණය වෙත සක්‍රීය දායකත්වයක් ලබාදීම විමර්ශනවාදී පද්ධතිය මගින් අවශ්‍ය කරයි. කෙසේ නමුත්, ආරවුල් විසඳාගැනීම සහ තනි පුද්ගලයිට සහ සමාජයට යුක්තිය සාක්ෂාත් කර ගැනීමේදී මෙම පද්ධතීන් ද්විත්වය තුළම ආවේණික අඩුපාඩු පවතියි.

මෙම පද්ධතීන් දෙකෙහි මූලික ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයෙහි වලංගුතාවය පිළිබඳව අදහස් දක්වන්න.

අ.පි.බ.

03. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) ව්‍යුටපොරේ යනු ඉන්දියානු සාගරයේ දූපත් රාජ්‍යයක් වෙයි. ව්‍යුටපෝරේහි ශිෂ්‍යයන් ඔවුන්ගේ පාසල් කාලයෙන් පසුව ටියුෂන් පන්තිවලට සහභාගී වන අතර එම පෞද්ගලික පන්ති සංස්කෘතිය ඔවුන්ගේ විවේකයට හා සෞඛ්‍යයට බලපෑම් ඇති කරයි. පෞද්ගලික පන්ති මධ්‍යස්ථාන රාත්‍රිය පසුවන තෙක් පන්ති පවත්වන බැවින් රටතුළ පෞද්ගලික පන්ති පවත්වන කාලය පාලනය කිරීම සඳහා ව්‍යුටපෝස් රජය පනතක් හඳුන්වා දී තිබෙයි. පනතට අනුව "පස්වරු 6 වන විට සියලුම පෞද්ගලික පන්ති මධ්‍යස්ථාන වසා දැමිය යුතුය." ඇල්පා, පෞද්ගලික පන්ති මධ්‍යස්ථානයෙහි හිමිකරුවන ලාල් පස්වරු 6 වන විට ඔහුගේ පෞද්ගලික පන්ති මධ්‍යස්ථානය වසා පස්වරු 6.15 ට නැවත එය ආරම්භ කර මධ්‍යම රාත්‍රිය පසුවන තෙක් පෞද්ගලික පන්ති මධ්‍යස්ථානය පවත්වාගෙන ගියේය. පනත උල්ලංඝනය කිරීමට එරෙහිව ඔහුට නඩු පනරනු ලබයි. පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව තමා පස්වරු 6 ට පෞද්ගලික පන්ති මධ්‍යස්ථානය වසා දමා තිබූ හෙයින් ඔහු කිසිදු වරදක් සිදුකර නොමැති බවට ලාල් තර්ක කරයි.

චූදිත පක්ෂය වෙනුවෙන් ඔබ පෙනී සිටින්නේ යැයි උපකල්පනය කරන්න. අදාළ ව්‍යවස්ථා අර්ථ නිරූපණ රීතීන් යොදා ගනිමින් ඔබ මෙම නඩුව තර්ක කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ආ) රැග්පෝරේ, ඉන්දියානු සාගරයේ දූපත් රාජ්‍යයකි. අධ්‍යාපන ආයතනයන් තුළ නවකවදය තහනම් කිරීමේ පනතක් රැග්පෝරේ රජය පනවා තිබෙයි. "අධ්‍යයන ආයතනයක සිසුවෙකුට භෞතික හෝ මානසික පීඩාවක් හෝ මානසික වේදනාවක් හෝ බියක් ඇතිවන හෝ ඇති වීමට ඉඩ ඇති ඔටුනෑම ක්‍රියාවක් අධ්‍යයන ආයතනයක් තුළ හෝ ඉන් බැහැරව සිදු කිරීම නවකවදය ලෙස" පනත මගින් දක්වයි. මධ්‍යකුල වාර්තාවන ලෙසට, ABC විශ්වවිද්‍යාලයෙහි ජ්‍යෙෂ්ඨ සිසුන් විසින් ප්‍රථම වසර සිසුන් හට නවකවදය ලබාදෙන අතර තුර හිස මුඩු කරනු ලබයි. පොලිසිය වෙත ලැබුණු ඔත්තුවක් මත විශ්වවිද්‍යාලය අසල වූ බාබර් සාප්පුව හය දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ සිසුන් හය දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ සිසුන් තිදෙනෙකු බාබර් සාප්පුව තුළ වාඩි වී සිටිනු සොයා ගනු ලැබිණි. ප්‍රථම වසර සිසුන් තමන්ගේ ගමන්මඵ ඔවුන්ගේ දේශනශාලාව තුළ කබා දේශන පැවැත්වෙන අතරතුර බාබර් සාප්පුව වෙත පැමිණ තිබිනි. ප්‍රථම වසර සිසුන්ගේ හිස මුඩුකරන ලෙස ජ්‍යෙෂ්ඨ සිසුන් තමාවෙත උපදෙස් ලබා දී තිබූ බව බාබර් සාප්පුවේ හිමිකරු පැවසීය.

අ.පි.බ.

නවකවදය සිදු කිරීම පිළිබඳව චෝෂ්‍ය සිසුන් තිදෙනා පනත යටතේ අභිචෝදනා කරනු ලැබිණි. පොලිසිය බාබර් සාප්පුවට පැමිණි විට ප්‍රථම වස සිසුන්ගේ හිස මුඩුකර නොතිබුනු හෙයින් තමන් පනත යටතේ කිසිදු වරදක් සිදුකර නොමැතිබවට චෝෂ්‍ය සිසුහු තර්ක කරති.

ඔබ අභිචෝදක පක්ෂය වෙනුවෙන් පෙනී සිටින්නේ යයි උපකල්පනය කරන්න. අදාළ ව්‍යවස්ථා අර්ථ නිරූපණ රීතිය යොදා ගනිමින් මෙම නඩුව ඔබ තර්ක කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

04. A, B සහ C යන කරුණු පදනම් වූ නඩුවක් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ විභාග වෙමින් පවතියි. ඔබගේ පිළිතුර සනාථ කිරීමට සඳහා අදාළ අධිකාරීන් උපුටා දක්වමින් පහත දැක්වෙන නඩු තීන්දුවල අනුකූලතාවය සාකච්ඡා කරන්න.

(අ) A, B සහ C යන කරුණු මත පදනම් වූ 1987 වසරේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් පූර්ණාධිකරණ [Full Bench] තීන්දුවක්;

(ආ) A, B C සහ D යන කරුණු පදනම් කරගෙන ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වූ අභියාචනයක් සම්බන්ධයෙන් රාජාධිකරණයෙහි [Privy Council] තීන්දුවක්;

(ඇ) A, B සහ C යන කරුණු පදනම්ව නවශ්‍රීලන්තයේ අභියාචනාධිකරණය 2004 වසරේදී ලබාදුන් තීන්දුවක්; සහ

(ඈ) A, B සහ C යන කරුණු පදනම්ව ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණයෙහි විනිසුරන් තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් 2017 වසරේදී ලබාදුන් තීන්දුවක්.

05. "සීලු" යනු සීලැන්ඩ් රාජ්‍යයෙහි ධීවර සහ කෘෂිකර්මාන්තයෙහි යෙදෙන ආවේණික ජනකොටසකි. සීලු ජනකොටසෙහි පවතින සාම්ප්‍රදායික පරිචයක් මගින් එම ජනකොටස තුළ සිටින නවයොවුන් ගැහැණු ළමුන්ගේ කාන්තා ලිංග ඡේදනය සිදුකිරීම අවශ්‍ය වෙයි. සීලු ජන කොටසෙහි සාමාජිකයන් විසින් මෙම සාම්ප්‍රදායික පරිචය ඇඩිලෙස පිළිගනු ලබයි. 2018 ජුනි මස, කාන්තා ලිංග ඡේදනයට මුහුණදීම සඳහා පෙලගැසී කඳුලු වගුරවමින් බියට පත් වී සිටි නවයොවුන් ගැහැණු ළමයින් දැක්වෙන රූපරාමු ඇතුළත් අන්තර්ජාල වීඩියෝවක් Women @ Lead නම් කාන්තා අයිතිවාසිකම් සංවිධානය විසින්

අ.පි.බ.

සොයා ගැනිණි. ජන කොටසෙහි වැඩිහිටියන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක් සිදුකර ඇති බවට Women @ Lead චෝදනා කරයි. මෙම පරිචය කාන්තාවන්ගේ ආත්ම ගරුත්වයට ඇති අයිතියට පටහැනි වන සහ එය උල්ලංඝනය කරන බවට එය තවදුරටත් තර්ක කර සිටියි. කෙසේ නමුත්, මෙම පරිචය ජන කොටස තුළ දීර්ඝ කාලයක් පැවතඑන මිනිසුන්ගේ සිත්වල මෙන්ම සංස්කෘතියෙහිද ගැඹුරට කිඳා බැස ඇති සම්ප්‍රදායක් බව සීලු ජන කොටසෙහි නායකයා කියා සිටියි. කාන්තාවන්ගේ ලිංගික ආශාවන් තුහිනි කිරීම සඳහා පිළිවෙතක් ඉටුකිරීම පමණක් ඔවුන් සිදුකර ඇති නිසා ජනකොටසේ නායකයා සහ වැඩිහිටියන් එම චෝදනාව ප්‍රතික්ෂේප කර සිටිති.

චාරිත්‍රයෙහි වලංගුතාව පිළිබඳව Women @ Lead ඔබගේ උපදෙස් පතයි. අදාළ නඩු තීරණ උපුටා දක්වමින් එයට උපදෙස් දෙන්න. සීලැන්ඩ් හි අදාළ නීතින් ශ්‍රී ලංකාවෙහි නීතියට සමානයයි උපකල්පනය කරන්න.

06. ස්ත්‍රීරසාර සාම කේන්ද්‍රය යනු රාජ්‍ය නොවන සංවිධානයකි. "ස්ත්‍රීරසාර සාමය සඳහා සමතකරනය" යන මැයෙන් මධ්‍යම පළාතේ සිටින රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු කරන නවක නීතිඥයන්හට වැඩමුළුවක් එය සංවිධානය කොට තිබෙයි. "සමාජය තුළ ස්ත්‍රීරසාර සාමය ප්‍රවර්ධනය කිරීමට සමත මණ්ඩලවල කාර්යයභාරය" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදුකරන මෙන් එම කේන්ද්‍රය ඔබගෙන් ඉල්ලා තිබෙයි. අනෙකුත් දේවල් අතර, සමතකරණයේ නෛතික සහ ප්‍රායෝගික අංගයන් ඔබගේ ඉදිරිපත් කිරීම තුළට අන්තර්ගත කරන මෙන් කේන්ද්‍රය ඔබගෙන් තවද ඉල්ලා සිටියි.

ඔබගේ ඉදිරිපත් කිරීම තුළ කවරක් ඔබ අන්තර්ගත කරන්නේදැයි පැහැදිලි කරන්න.

07. (අ) සමාජය නගාසිටුවීම සඳහා නීතිඥයින් විවිධ ආකාරයෙන් ස්වෙච්ඡාවෙන් කටයුතුකල හැකිය. සමාජය නගා සිටුවීම හැකිවන ආකාරයේ නීතිඥයන්ට ස්වෙච්ඡාවෙන් සිදුකළ හැකි දායකත්වයෙන් ඕනෑම තුනක් හඳුනාගන්න. එබඳු දායකත්වය තුලින් ජනකොටස් කෙසේ නගාසිටුවිය හැකිදැයි හේතු දක්වමින් පැහැදිලි කරන්න.

(ආ) නීති වෘත්තීය කෙරෙහි සමාජය තබා ඇති විශ්වාසය බරපතල ලෙස අවප්‍රමාණය වීමට ඔබගේ මතය අනුව හේතුවන නීතිඥයන්ගේ හැසිරීම් සඳහා නිදසුන් දක්වන්න. නීති වෘත්තය කෙරෙහි එබඳු හැසිරීම් අයහපත් ලෙස බලපෑ හැකි ආකාරය හේතු දක්වමින් පැහැදිලි කරන්න.

o◦o◦o◦o◦o◦o◦o◦